# 4 වන ඒකකය
## ශාක පෝෂණය

(1) පසක අත්‍යාවශ්‍ය මූලද්‍රව්‍යවලින් වැඩි හරියක් ලබාගත හැකි ආකාරයේ පවතින pH පරාසය වනුයේ,
1) 4.5 ට අඩු අගයන් ය    2) 4.5 හා 6.5 අතර ය    3) 8.0 ට වැඩි අගයන් ය
4) 7.0 හා 8.0 අතර ය    5) 6.5 හා 7.0 අතර ය    (2000)

(2) එක්තරා ශාකයක වර්ණය මලානික කොළ පැහැයට හැරිණි. ඉන්පසු පරිණත පත්‍ර කහ විය. වර්ධනය බාල විය.
ඉහත ලක්ෂණවලට අනුව මෙම ශාකය,
1) N ඌණතාවය පෙන්වයි.    2) Mg ඌණතාවය පෙන්වයි
3) K ඌණතාවය පෙන්වයි.    4) B ඌණතාවය පෙන්වයි.
5) Mn ඌණතාවය පෙන්වයි.    (2000)

(3) කාබනික ද්‍රව්‍ය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
A) ඕනෑම ජීර්ණය වූ කාබනික ද්‍රව්‍යයක් කොම්පෝස්ට් ලෙ27සරුලකිය හැකි ය.
B) C/N අනුපාතය හා pH අගය සකස් කිරීම සඳහා කොම්පෝස්ට් ගොඩට ආරම්භක මිශ්‍රණය ඇතුල් කරනු ලැබේ.
C) C/N අනුපාතය අධික ද්‍රව්‍ය ජීර්ණය කිරීමට පහසු ය.
ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ,
1) A පමණි.    2) B පමණි.    3) C පමණි.
4) A හා B පමණි.    5) A හා C පමණි.    (2000)

(4) පසට කොම්පෝස්ට් එකතු කිරීමෙන්,
1) රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවය වැඩි වේ.
2) රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවය අඩු වේ.
3) රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවයට බලපෑමක් සිදු නොවේ.
4) රසායනික පොහොර සමග මිශ්‍ර වී ශාකයට හානිකර බලපෑම් ඇති වේ.
5) පාංශු ක්ෂුද්‍රජීවී ගහණය අඩු වේ.    (2001)

(5) කොම්පෝස්ට් ගොඩ සාමාන්‍යයෙන් මතුපිට පස් හෝ පරිණත කොම්පෝස්ට් වලින් වසනු ලැබේ. මෙය කරනු ලබන්නේ,
1) කොම්පෝස්ට් ගොඩ හිරු එළියෙන් රැක ගැනීමට ය.
2) කොම්පෝස්ට් ගොඩ මීයන් වැනි මහා පළිබෝධයන්ගෙන් රැක ගැනීමට ය.
3) ජීර්ණයේ දී කොම්පෝස්ට් ගොඩෙන් නිකුත්වන වායු හසු කර ගැනීම සඳහා ය.
4) කොම්පෝස්ට් ගොඩෙන් නිකුත් වන දුර්ගන්ධය අඩු කිරීම සඳහා ය.
5) කොම්පෝස්ට් ගොඩ වර්ෂාවෙන් රැක ගැනීමට ය.    (2001)

(6) අත්‍යාවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය සඳහා උදාහරණ වනුයේ,
1) සල්ෆර්, මොලිබ්ඩිනම් සහ කොපර් වේ.    2) පොස්පරස්, සින්ක් සහ ක්ලෝරීන් වේ.
3) මැග්නීසියම්, කැල්සියම් හා මැංගනීස් වේ.    4) මැංගනීස්, අයන් සහ බෝරෝන් වේ.
5) සල්ෆර්, කොපර් හා සින්ක් වේ.    (2001)

(7) පෘථිවි කබොල්ලේ වඩාත්ම සුලභ මූලද්‍රව්‍ය වනුයේ,
1) කාබන් සහ සිලිකන් ය.    2) ඔක්සිජන් සහ සිලිකන් ය.
3) ඔක්සිජන් සහ ඇලුමිනියම් ය.    4) කාබන් සහ ඔක්සිජන් ය.
5) ඇලුමිනියම් සහ යකඩ ය.    (2002)

(8) ශාකවල හරිතක්ෂය ඇති වනුයේ,
1) Mg, Fe, N ඌන වූ විට ය.    2) Fe, S, N ඌන වූ විට ය.    3) Mo, Fe, S ඌන වූ විට ය.
4) Mo, N, Cu ඌන වූ විට ය.    5) Ca, P, K ඌන වූ විට ය.    (2002)

(9) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පස්වලට නයිට්‍රජන් පොහොරක් ලෙස ඇමෝනියම් සල්ෆේට් වෙනුවට ප්‍රධාන වශයෙන් යූරියා නිර්දේශ කරනුයේ යූරියා,
1) පසට අඩුවෙන් නයිට්‍රජන් සපයන බැවිනි.
2) පස ආම්ලික නොකරන බැවිනි.
3) පසේ ස්වාරක්ෂක ධාරිතාව දියුණු කරන බැවිනි.
4) පසේ භාස්මිකතාව අඩු කරන බැවිනි.
5) ශාකවලට ලබාගත හැකි නයිට්‍රජන් සුලභතාවය දියුණු කරන බැවිනි. (2002)

(10) පහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වන්නේ,
1) නිර්වායු තත්ත්ව යටතේ කොම්පෝස්ට් සෑදෙන විට විෂ කාබනික අම්ල නිපද වේ.
2) මිනිසාගේ මැදිහත්වීමකින් තොරව කොම්පෝස්ට් සෑදිය හැකි ය.
3) කොම්පෝස්ට් ක්‍රියාවලියේ දී පෝෂක බොහොමයක් වායු ආකාරයෙන් ඉවත් වේ.
4) ස්වායු තත්ත්ව යටතේ කොම්පෝස්ට් සෑදෙන විට දුර්ගන්ධයක් නිකුත් වේ.
5) ක්ෂුද්‍රජීවීන්ගේ උපකාරයෙන් තොර පවා කොම්පෝස්ට් සෑදිය හැකි ය. (2002)

(11) ක්ලෝරීන්,
1) සචල අත්‍යවශ්‍ය මහාමූලද්‍රව්‍යයක් සේ සැලකේ.
2) සචල අත්‍යවශ්‍ය ක්ෂුද්‍රමූලද්‍රව්‍යයක් සේ සැලකේ.
3) අචල අත්‍යවශ්‍ය මහාමූලද්‍රව්‍යයක් සේ සැලකේ.
4) අචල අත්‍යවශ්‍ය ක්ෂුද්‍රමූලද්‍රව්‍යයක් සේ සැලකේ.
5) අත්‍යවශ්‍ය නොවන මූලද්‍රව්‍යයක් සේ සැලකේ. (2003)

(12) බෝගයක ඉහළම බෝග සංගුණකය දක්නට ලැබෙනුයේ එම බෝගයේ,
1) පැළ අවස්ථාවේ දී ය.
2) ක්‍රියාකාරී වර්ධක අවස්ථාවේ දී ය.
3) ප්‍රජනක අවස්ථාවේ දී ය.
4) පරිණත අවස්ථාවේ දී ය.
5) පැළ සහ පරිනත යන අවස්ථාවල දී ය. (2003)

(13) ශාකවල සල්ෆර් ඌනතා ලක්ෂණය / ලක්ෂණ වනුයේ,
1) පළමුව 28සරු පත්‍රවල දක්නට ලැබෙන හරිතක්ෂ තත්ත්වය වේ.
2) 28සරු පත්‍රවල ඇතිවන අන්තර් නාරටි හරිතක්ෂය වේ.
3) පළමුව ලපටි පත්‍රවල දක්නට ලැබෙන හරිතක්ෂ තත්ත්වය වේ.
4) රැළි සහිත පත්‍ර අඩංගු කුරු ශාක වේ.
5) ළපටි පත්‍රවල ඇති පිලිස්සුණු පත්‍ර දාර සහ නෙක්රොසිය ලප වේ. (2003)

(14) පත්‍රවල ඇන්තොසයනින් වර්ණකය වර්ධනය වීම දක්නට ලැබෙන්නේ,
1) N ඌනතාවය හේතුවෙනි.
2) Zn ඌනතාවය හේතුවෙනි.
3) Mg ඌනතාවය හේතුවෙනි.
4) P ඌනතාවය හේතුවෙනි.
5) Ca ඌනතාවය හේතුවෙනි. (2003)

(15) පෘථිවි කබොල්ලේ වඩාත් ම බහුලව ඇති මූලද්‍රව්‍ය හතර වනුයේ,
1) කාබන්, සිලිකන්, යකඩ සහ කැල්සියම් ය.
2) ඔක්සිජන්, සිලිකන්, යකඩ සහ මැග්නීසියම් ය.
3) සිලිකන්, ඔක්සිජන්, ඇලුමිනියම් සහ යකඩ ය.
4) ඇලුමිනියම්, යකඩ, මැග්නීසියම් සහ ඔක්සිජන් ය.
5) කාබන් , මැග්නීසියම්, යකඩ සහ සිලිකන් ය. (2003)

(16) තද කොළ හා දම් පැහැති පත්‍ර, කුරු ශාක හා මුල් වර්ධනය අඩුවීම ආදී ඌනතා ලක්ෂණ ඇති වනුයේ,
1) Mg අඩු වූ විට ය.
2) Ca අඩු වූ විට ය.
3) Fe අඩු වූ විට ය.
4) Zn අඩු වූ විට ය.
5) P අඩු වූ විට ය. (2004)

(17) තුත්තනාගම් (Zinc)
1) අත්‍යවශ්‍ය මහා මූලද්‍රව්‍යයකි.
2) අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයකි.
3) අත්‍යවශ්‍ය නොවන මූලද්‍රව්‍යයකි.
4) ශාකවලට විෂ ද්‍රව්‍යයකි.
5) ජිප්සම්වල අඩංගු ද්‍රව්‍යයකි. (2004)

➢ **ප්‍රශ්න අංක 18 ට පිළිතුරු සැපයීම සඳහා මෙහි දැක්වෙන රූප සටහන උපයෝගී කර ගන්න.**




(18) රූප සටහනේ C ව්‍යුහය ප්‍රධාන වශයෙන් යොදා ගන්නේ,
1) බෝගයට රසායනික පොහොර යෙදීමට ය.
2) බෝගයට දියර පොහොර යෙදීමට ය.
3) ක්ෂේත්‍රයේ සිටින පළිබෝධ අල්ලා ගැනීමට ය.
4) කාබනික කසල දැමීමට ය.
5) ඊළඟ බෝගය ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා ය.
(2004)

(19) ශාක කිසි දිනක කාබන්, හයිඩ්‍රජන් හා ඔක්සිජන් ඌනතා ලක්ෂණ **නොපෙන්වන්නේ,**
1) රසායනික පොහොර මඟින් මෙම මූලද්‍රව්‍ය ශාකයට ලබාගත හැකි බැවිනි.
2) කාබනික පොහොර මඟින් මෙම මූලද්‍රව්‍ය ශාකයට ලබාගත හැකි බැවිනි.
3) පසෙන් මෙම මූලද්‍රව්‍ය ශාකයට ලබාගත හැකි බැවිනි.
4) පාංශු ජලයෙන් හා වායුගෝලයෙන් මෙම මූලද්‍රව්‍ය ශාකයට ලබාගත හැකි බැවිනි.
5) මෙම මූලද්‍රව්‍ය ශාකය තුළම සංස්ලේෂණ කර ගැනීමට ශාකයට හැකි බැවිනි. (2004)

(20) කැල්සියම් සලකනු ලබන්නේ,
1) අත්‍යවශ්‍ය චල මහා මූලද්‍රව්‍යයක් ලෙස ය.
2) අත්‍යවශ්‍ය චල ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයක් ලෙස ය.
3) අත්‍යවශ්‍ය අචල මහා මූලද්‍රව්‍යයක් ලෙස ය.
4) අත්‍යවශ්‍ය අචල ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයක් ලෙස ය.
5) අත්‍යවශ්‍ය නොවන මූලද්‍රව්‍යයක් ලෙස ය. (2005)

(21) නයිට්‍රජන් පොහොර සඳහා පොහොර කාර්යක්ෂමතාව 50% වේ නම්, මෙම බෝග ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය නයිට්‍රජන් පෝෂක ප්‍රමාණය වන්නේ,
1) 40kg /ha කි.
2) 46kg /ha කි.
3) 80kg /ha කි.
4) 86kg /ha කි.
5) 92kg /ha කි. (2005)

(22) යූරියාවල අඩංගු නයිට්‍රජන් ප්‍රමාණය 46% ක් නම්, මෙම බෝග ක්ෂේත්‍රයට යෙදිය යුතු යූරියා පොහොර ප්‍රමාණය වන්නේ,
1) 50kg /ha කි.
2) 100kg /ha
3) 150kg /ha කි.
4) 200kg /ha කි.
5) 2502kg /ha කි. (2005)

➢ **සමහර මූලද්‍රව්‍යවල වර්ගීකරණයක් පහත වගුවේ දැක්වේ. අංක 23, 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම වගුව උපයෝගී කර ගන්න.**

| A | B | C | D | E | F |
|---|---|---|---|---|---|
| C,H,O | N,P,K | Mg,Cl | Mo,Cu,Zn | Mn,S | Ca,B,Fe |

(23) චාලක මූලද්‍රව්‍ය **පමණක්** අයත්වන කාණ්ඩ වනුයේ,
1) A සහ B ය.
2) B සහ C ය.
3) C සහ D ය.
4) D සහ E ය.
5) E සහ F ය. (2006)

(24) මහා මූලද්‍රව්‍ය **පමණක්** අයත්වන කාණ්ඩ වනුයේ,
1) A සහ B ය.
2) B සහ C ය.
3) C සහ D ය.
4) D සහ E ය.
5) E සහ F ය. (2006)

(25) චාලක නොවන මූලද්‍රව්‍ය **පමණක්** අයත්වන කාණ්ඩ වනුයේ,
1) B
2) C
3) D
4) E
5) F (2006)

(26) **වත්මන් පොහොර සහනාධාරය වඩාත් හොඳින් දැක්විය හැක්කේ,**
1) සියලුම වගාවන්ට සැපයෙන N,P,K පොහොර සහනාධාරයක් ලෙස ය.
2) ගෙවතු වගා සඳහා සැපයෙන N,P,K පොහොර සහනාධාරයක් ලෙස ය.
3) වැවිලි බෝග නොවන බෝග සඳහා සැපයෙන N,P,K පොහොර සහනාධාරයක් ලෙස ය.
4) වී,තේ,රබර්,පොල් හා සුළු අපනයන බෝග සඳහා සැපයෙන N,P,K පොහොර සහනාධාරයක් ලෙස ය.
5) වී සඳහා සැපයෙන N පොහොර සහනාධාරයක් ලෙස ය. (2006)

(27) ශිෂ්‍යයෙකුට තමා සතු බීජ නියැදියක ජීව්‍යතාව පරීක්ෂා කිරීමට අවශ්‍ය විය. එහෙත් බීජ නියැදියේ සුප්තතාව පිළිබඳ කිසිම තොරතුරක් ඔහු සතුව නොතිබිණි. මෙම බීජ නියැදියේ ජීව්‍යතාව පරීක්ෂා කිරීමට වඩාත්ම සුදුසු ක්‍රමය වනුයේ,
1) පෙට්රි දීසි ක්‍රමයයි. 2) රැගඩෝල් ක්‍රමයයි. 3) තවාන් පෙට්ටි ක්‍රමයයි.
4) උණුසුම් ජල ප්‍රතිකාර ක්‍රමයයි. 5) ටෙට්රාසෝලියම් ක්ලෝරයිඩ් ක්‍රමයයි. (2007)

(28) ශිෂ්‍යයකු විසින් බෝග ශාකයක් මත පහත ලක්ෂණ නිරීක්ෂණය කරන ලදී.
* පරිණත පත්‍රවල වර්ණය ළා කොළ පැහැයේ සිට කහ පැහැය දක්වා වෙනස් විය.
* මෙම වර්ණ වෙනස පටකය පුරාම ඒකාකාර විය.
මෙම තත්ත්වයට හේතුව කුමන මූලද්‍රව්‍යයක ඌනතාව විය හැකි ද?
1) N 2) Ca 3) Cu 4) Mn 5) Fe (2007)

(29) වාර්ෂික බෝග සඳහා එප්පාවල රොක් පොස්පේට් නිර්දේශ **නොකිරීමට** ප්‍රධාන හේතුව,
1) එහි අවශ්‍ය පමණ $P_2O_5$ අඩංගු නොවීමයි.
2) එය දේශීය වෙළඳපොළෙහි පහසුවෙන් ලබා ගත නොහැකි වීමයි.
3) එය $P_2O_5$ සෙමින් නිදහස් කිරීමයි.
4) එහි අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක අඩංගු නොවීමයි.
5) එය වාර්ෂික බෝගවලට විෂ වීමයි. (2007)

(30) ආම්ලික පසෙහි වඩාත්ම ලබාගත නොහැකි ක්ෂුද්‍ර මූලද්‍රව්‍යය වනුයේ,
1) Fe ය. 2) Cu ය. 3) Mo ය. 4) Zn ය. 5) B ය. (2008)

(31) ගොවියෙක් තමන්ගේ ක්ෂේත්‍රයෙහි සිට්‍රස් හා කෝපි ශාකවල සෙව්වන්දියක ආකාරයට සකස් වූ පත්‍රත්, තේ ශාකවල දැකැති හැඩය ගත් පත්‍රත් නිරීක්ෂණය කළේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය හැක්කේ,
1) B ඌනතාවයි. 2) Zn ඌනතාවයි. 3) Mo ඌනතාවයි.
4) Ca ඌනතාවයි. 5) N ඌනතාවයි. (2008)

(32) ජල දේහ තුළට පොහොර අපධාවය වීමෙන් ඇතිවන වඩාත් සුලබ බලපෑම වන්නේ,
1) සුපෝෂණය වේ. 2) කබලු මසුන් (Crustaceans) මැරියාම වේ.
3) ඇල්ගේ වර්ධනය අඩුවීම වේ. 4) ජලදේහවල රොන් මඩ තැන්පත්වීම වේ.
5) මත්ස්‍ය ගහණය වැඩිවීම වේ. (2009)

(33) පසෙහි තිබෙන පොස්පරස්, ශාකවලට ලබා ගත **නොහැකි** තත්ත්වයට පත්වන්නේ,
1) ඉහළ pH අගයක් ඇති විට, පොස්පරස්, ජල අද්‍රාව්‍ය ආකාරයට පත්වන නිසා ය.
2) පොස්පරස් පහසුවෙන් වාෂ්පීකරණය විය හැකි නිසා ය.
3) ඉහළ උෂ්ණත්වය නිසා පොස්පරස් අවසාදනය වන නිසා ය.
4) පොස්පරස් පහසුවෙන් ජලයේ දිය නොවන නිසා ය.
5) පාංශු කලිල පොස්පරස් අධිශෝෂණය කරගන්නා නිසා ය. (2009)

(34) කොම්පෝස්ට් පිළිබඳව පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) "කාබනික ද්‍රව්‍ය ජීරණය වීම ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ බැක්ටීරියා හා ඇක්ටිනොමයිසීටීන් මගිනි" යන්නයි.
2) "කොම්පෝස්ට් ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් සිදු කරනුයේ දිලීර මගිනි" යන්නයි.
3) "80 °C ඉහළ උෂ්ණත්වය කොම්පෝස්ට් ක්‍රියාවලිය වේගවත් කරයි." යන්නයි.
4) "කොම්පෝස්ට් ක්‍රියාවලිය නිසා රොක්පොස්පේට්වල ද්‍රාව්‍යතාව අඩු වේ." යන්නයි.
5) "කොම්පෝස්ට් ක්‍රියාවලියේ දී C : N අනුපාතය වැඩි ද්‍රාව්‍ය ඉක්මනින් ජීරණය වේ." යන්නයි. (2009)

(35) ශාක පෝෂක, මහා පෝෂක හා ක්ෂුද්‍ර පෝෂක ලෙස කාණ්ඩගත කර ඇත. මෙම පෝෂක පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1) ''ක්ෂුද්‍ර පෝෂක, ශාකයේ පැවැත්මට අත්‍යවශ්‍ය නොවන අතර, ඒවා ඇති විට ශාකයේ වර්ධනය ශීඝ්‍ර වේ.''යන්නයි.
2) ''මහා පෝෂක හා ක්ෂුද්‍ර පෝෂක දෙවර්ගයම ශාකවල පැවැත්මට අත්‍යවශ්‍ය ය.'' යන්නයි.
3) ''මහා පෝෂකවල අණු ක්ෂුද්‍ර පෝෂකවල අණුවලට වඩා ප්‍රමාණයෙන් විශාල ය.'' යන්නයි.
4) ''ශාක පළමුව මහා පෝෂක අවශෝෂණය කරන අතර, මහා පෝෂකවල හිඟයක් ඇති විට, ශාක, ක්ෂුද්‍ර පෝෂක අවශෝෂණයට පෙළඹේ.'' යන්නයි.
5) ''මහා පෝෂක, පසෙහි ස්වාභාවිකව පවතින අතර, ක්ෂුද්‍ර පෝෂක පසෙහි ස්වාභාවිකව නොපවතී.'' යන්නයි. (2009)

(36) පොහොර බෑගයක් 23-19-17 ලෙස ලේබල් කර ඇත්නම්,

1) එහි 23% ක් N ද 19% ක් K ද 17% ක් P ද, අඩංගු වේ.
2) එහි 23% ක් N ද 19% ක් $P_2O_5$ ද 17% ක් $K_2O$ ද, අඩංගු වේ.
3) එය ශාකවල N අවශ්‍යතාවයෙන් 23% ක් ද, P අවශ්‍යතාවයෙන් 19% ක් ද, K අවශ්‍යතාවයෙන් 17% ක් ද සපයයි.
4) එය ශාකවල N අවශ්‍යතාවයෙන් 23% ක් ද, K අවශ්‍යතාවයෙන් 19% ක් ද, P අවශ්‍යතාවයෙන් 17% ක් ද සපයයි.
5) එය N කිලෝග්‍රෑම් 23 ක් ද, P කිලෝග්‍රෑම් 19 ක් ද, $K_2O$ කිලෝග්‍රෑම් 17 ක් ද සපයයි. (2010)

(37) උයන්පල්ලෙකුට ඔහුගේ වර්ගමීටර 2000 ක් වන තණතිල්ල සඳහා වර්ගමීටර 1000 කට කිලෝග්‍රෑම් 1 ලෙස නයිට්‍රජන් යෙදීමට අවශ්‍ය වී ඇත. ඔහු 16 : 16 : 8 ලේබලය යටතේ ඇති පොහොර මිශ්‍රණයක් මිල දී ගැනීමට අපේක්ෂා කරන්නේ නම් මේ සඳහා ඔහුට අවශ්‍ය මුළු පොහොර ප්‍රමාණය වනුයේ කිලෝග්‍රෑම්,

1) 1.25 කි. 2) 2 කි. 3) 12.5 කි. 4) 16 කි. 5) 32 කි. (2010)

(38) පසෙහි පොස්පරස් සුලබතාව පිළිබඳ වගන්ති කිහිපයක් පහත දක්වේ.

A – ඉහළ pH තත්ත්වයක් යටතේ පොස්පරස් ජල අද්‍රාව්‍ය බවට පත් වේ.
B – පොස්පරස්, ජලයේ දිය වී ක්ෂීරණය විය හැකි ය.
C – උණුසුම් පාංශු උෂ්ණත්ව යටතේ පොස්පරස් ශාකයට ලබාගත නොහැකි තත්ත්වයට පත් වේ.
D – පොස්පරස් පසෙහි කාබනික කලිලවලට බන්ධනය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

1) A සහ B පමණි. 2) A සහ C පමණි. 3) A, B සහ C පමණි.
4) A,B සහ D පමණි. 5) B,C සහ D පමණි. (2010)

(39) ගොවියෙක් වාණිජ තවානකින් මිල දී ගත් මිරිස් පැළ කිහිපයක් ඔහුගේ ගෙවත්තේ වගා කළේ ය. සති කිහිපයකට පසු පැරණි පත්‍ර කහ පැහැගත් වී ඇති අතර, අලුත් පත්‍ර කොළ පැහැයෙන් හා නිරෝගීව පවතින බව ඔහු විසින් නිරීක්ෂණය කරන ලදී. මෙයට වඩාත්ම බලපෑ හැකි හේතුව වනුයේ,

1) පැළ, පසේ වඩාත් ගැඹුරට සිටුවීම යි. 2) පැළ, පසේ වඩාත් මතුපිට සිටුවීමයි.
3) නයිට්‍රජන් ඌනතාවයි. 4) පොස්ෆේට් ඌනතාවයි.
5) කැල්සියම් ඌනතාවයි. (2011)

➤ **ප්‍රශ්න අංක 40 හා 41 ට පිළිතුරු දීම සඳහා පහත රූප සටහන භාවිත කරන්න.**

Light – ආලෝකය
Heat – තාපය
Mechanical support – යාන්ත්‍රික උපකාරය
Organic matter – කාබනික ද්‍රව්‍ය
Nitrogen – නයිට්‍රජන්
Potassium – පොටෑසියම්
Phosphorus – පොස්පරස්
Other nutrients – අනෙකුත් පෝෂක
Water – ජලය
Air – වාතය



A B

(40) ඉහත රූප සටහනට අනුව,
1) A හා B පස්වල පිළිවෙලින් නයිට්‍රජන් හා පොටෑසියම් අතිරික්ත ප්‍රමාණවලින් ඇත.
2) A හා B පස් වර්ග දෙකෙහිම ප්‍රමාණවත් තරම් ආලෝකය, යාන්ත්‍රික උපකාරය හා වාතය නැත.
3) A හා B පස්වල සීමාකාරී සාධක පිළිවෙලින් නයිට්‍රජන් හා පොටෑසියම් වේ.
4) A හා B පස් වර්ග දෙකෙහිම N,P,K සීමාකාරී සාධක බවට පත් වී ඇත.
5) A පසෙහි ජල ප්‍රමාණය B පසට සාපේක්ෂව අඩු ප්‍රමාණයක් පවතී. (2011)

(41) ඉහත රූප සටහනෙහි පැහැදිලි වනුයේ,
1) නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ නියමය වේ.
2) මෙන්ඩල්ගේ ප්‍රවේණික නියමය වේ.
3) ලීබිග්ගේ අවමය පිළිබඳ නියමය වේ.
4) නිව්ටන්ගේ චලනය පිළිබඳ නියමය වේ.
5) ආකිමිඩිස්ගේ ඉපිලුම් නියමය වේ. (2011)

(42) කාබනික පොහොර භාවිතයේ ප්‍රතිලාභයක් වනුයේ,
1) පසේ ජලය රඳා ගැනීමේ ධාරිතාව වැඩි දියුණු වීම ය.
2) පසට අවශ්‍ය පමණ නයිට්‍රජන් ලබා දීම ය.
3) ශාක පෝෂක ඉක්මනින් පාංශු ජලයට නිදහස් කිරීම ය.
4) පසට අවශ්‍ය පමණ පොස්පරස් ලබා දීම ය.
5) පසෙහි pH අගය 7 ඉක්මවා වැඩි කිරීම ය. (2011)

(43) ශාකයකට සැලකිය යුතු තරම් විශාල ප්‍රමාණවලින් අවශ්‍ය වන නයිට්‍රජන්, පොටෑසියම් සහ පොස්පරස් වැනි මූලද්‍රව්‍ය හඳුන්වනු ලබන්නේ,
1) පොහොර ලෙස ය.
2) සහඑන්සයිම ලෙස ය.
3) ක්ෂුද්‍රපෝෂක ලෙස ය.
4) මහා පෝෂක ලෙස ය.
5) එන්සයිම සක්‍රියකාරක ලෙස ය. (2012)

(44) ශාක පෝෂණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) බෝරෝන් ඌනතාව මිටි ස්ථූල කඳක් ඇති වීමට හේතු වේ.
2) නයිට්‍රජන් යනු අචල ශාක පෝෂකයකි.
3) සෛලයක් තුළ දක්නට ලැබෙන සෑම ඛනිජයක්ම සෛලයට අවශ්‍ය වේ.
4) හොඳින් සැකසූ පසක අත්‍යවශ්‍ය මූලද්‍රව්‍යවලින් තොරව ශාක වගා කළ හැකි ය.
5) අංශුමාත්‍ර ප්‍රමාණවලින් අවශ්‍ය වන නිසා ක්ෂුද්‍ර පෝෂක අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය ලෙස නො සැලකේ. (2012)

(45) "අවමය පිළිබඳ ලීබිග්ගේ නියමය" ට අනුව ශාකයක වර්ධනය සීමා කරන්නේ,
1) පසෙහි අවම ප්‍රමාණයකින් තිබෙන පෝෂකය මගිනි.
2) ශාකයට අවම ප්‍රමාණයකින් අවශ්‍ය කරන පෝෂකය මගිනි.
3) පසෙහි වැඩිම ප්‍රමාණයකින් තිබෙන පෝෂකය මගිනි.
4) ශාකයට වැඩිම ප්‍රමාණයකින් අවශ්‍ය කරන පෝෂකය මගිනි.
5) ශාකයට අවශ්‍ය අවම ප්‍රමාණය පමණක් පසෙහි තිබෙන පෝෂකය මගිනි. (2012)

(46) එක්තරා ශාක පෝෂක මූලද්‍රව්‍යයක ඌනතා ලක්ෂණ බෝගයක පරිණත පත්‍රවල හටගෙන තිබෙනු ශිෂ්‍යයෙකු විසින් නිරීක්ෂණය කරන ලදී. මෙම මූලද්‍රව්‍යය වඩාත් හොඳින් වර්ගීකරණය කළ හැක්කේ,
1) මහා මූලද්‍රව්‍යයක් ලෙස ය.
2) ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයක් ලෙස ය.
3) උපකාරක මූලද්‍රව්‍යයක් ලෙස ය.
4) චල මූලද්‍රව්‍යයක් ලෙස ය.
5) අචල මූලද්‍රව්‍යයක් ලෙස ය. (2013)

(47) ක්ෂුද්‍ර පෝෂක
1) කුඩා ප්‍රමාණයන්ගෙන් පමණක් පසෙහි පවතී.
2) කුඩා ප්‍රමාණයන්ගෙන් ශාකවලට අවශ්‍ය වේ.
3) ශාකවලට අවශ්‍ය වන කුඩා අණු වේ.
4) ශාකවලට ප්‍රයෝජනවත් නමුත් අත්‍යාවශ්‍ය නොවේ.
5) ශාක විසින් සිය මූලගෝලයට කුඩා ප්‍රමාණවලින් නිදහස් කෙරේ. (2014)

(48) pH අගය 5.5 ට අඩු ආම්ලික පසෙක ශාක වර්ධනයට වඩාත් බලපාන සීමාකාරී සාධකය වන්නේ,
1) Mn ඌනතාව වේ.
2) P ඌනතාව වේ.
3) AL ඌනතාව වේ.
4) Fe ඌනතාව වේ.
5) B ඌනතාව වේ. (2014)

(49) පාංශු විශ්ලේෂණයකින් පසුව ගොවියෙකුට සිය ක්ෂේත්‍රය සඳහා හෙක්ටයාරයකට නයිට්‍රජන් කිලෝ ග්‍රෑම් 100 බැගින් යොදන ලෙස දන්වන ලදි. මෙම පොහොර අවශ්‍යතාව සැපයීම සඳහා හෙක්ටයාරයකට යෙදිය යුතු යූරියා ප්‍රමාණය වනුයේ,
1) කිලෝ ග්‍රෑම් 45 කි. 2) කිලෝ ග්‍රෑම් 111 කි. 3) කිලෝ ග්‍රෑම් 145 කි.
4) කිලෝ ග්‍රෑම් 222 කි. 5) කිලෝ ග්‍රෑම් 333 කි. (2014)

(50) ශාකයකට Fe හා Mg අවශ්‍ය වන්නේ,
1) ඔක්සීන් සංශ්ලේෂණයට ය. 2) හරිතප්‍රද සංශ්ලේෂණයට ය.
3) ඛනිජ සක්‍රීය අවශෝෂණයට ය. 4) කාබෝහයිඩ්රේට් පරිසංක්‍රමණයට ය.
5) පූටිකා වැසීම හා විවෘත වීමට ය. (2015)

(51) බෝග ක්ෂේත්‍රයකට පොහොර යෙදීමේ අවස්ථාව පහත කරුණු මත රඳා පවතින බව ශිෂ්‍යයකු සඳහන් කර ඇත.
A – බෝග වර්ධක අවධිය B – පාංශු තෙතමනය C – පාංශු ආකාරය
ඉහත කරුණු අතුරෙන් නිවැරදි වන්නේ,
1) A පමණි 2) B පමණි 3) C පමණි 4) A හා B පමණි 5) A හා C පමණි (2015)

(52) පහත පොහොර අතුරෙන් වඩාත් සාන්ද්‍ර වූ බහුලව භාවිත වන ඝන නයිට්‍රජන් පොහොර වනුයේ,
1) යූරියා ය. 2) ඇමෝනියා ය. 3) ඇමෝනියම් සල්ෆේට් ය.
4) ඇමෝනියම් නයිට්‍රේට් ය. 5) ඩයිඇමෝනියම් පොස්ෆේට් ය. (2015)

(53) කැල්සියම් අත්‍යවශ්‍ය ශාක පෝෂකයක් ලෙස සලකනු ලබන්නේ එය,
1) සෛල බිත්තිවල සංඝටකයක් වන නිසා ය. 2) හරිතප්‍රදවල සංඝටකයක් වන නිසා ය.
3) ඇමයිනෝ අම්ලවල සංඝටකයක් වන නිසා ය. 4) සහඑන්සයිමවල සංඝටකයක් වන නිසා ය.
5) ADP හා ATP වල සංඝටකයක් වන නිසා ය. (2015)

(54) නිර්වායු තත්ත්ව යටතේ කුඹුරක පසකින් වායු ආකාරයෙන් නයිට්‍රජන් පොහොර හානි වනුයේ,
1) තිර වීමෙනි. 2) නයිට්‍රීකරණය වීමෙනි. 3) වාෂ්පශීලනය වීමෙනි.
4) නයිට්‍රීහරණය වීමෙනි. 5) ඇමෝනීකරණය වීමෙනි. (2016)

(55) යකඩ හා මොලිබ්ඩිනම් වැදගත් වන්නේ පිළිවෙළින්,
1) ප්‍රෝටීන සංස්ලේෂණයට හා ශ්වසනයට ය.
2) ජලය අවශෝෂණයට හා ධාන්‍ය පිරීමට ය.
3) ලිපිඩ ජෛව සංස්ලේෂණයට හා එන්සයිම ක්‍රියාත්මක කිරීමට ය.
4) ATP සෑදීමට සහ හරිතප්‍රද සංස්ලේෂණයට ය.
5) හරිතප්‍රද සංස්ලේෂණයට හා නයිට්‍රජන් තිර කිරීමට ය. (2016)

(56) කාබනික පොහොර පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) එය ඉක්මනින් පෝෂක නිදහස් කරයි.
2) පහත් බිම වී වගාව සඳහා එය යෙදිය නොහැකි ය.
3) එය අකාබනික පොහොර සමඟ නොයෙදිය යුතු ය.
4) එහි අඩංගු පෝෂක ප්‍රමාණය අකාබනික පොහොරෙහි අඩංගු පෝෂක ප්‍රමාණයට වඩා වැඩි ය.
5) මිශ්‍රව යෙදූ විට අකාබනික පොහොරවල, පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි වේ. (2016)

## 4 ඒකකය

## ශාක පෝෂණය

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 5 | (2) | 1 | (3) | 2 | (4) | 1 | (5) | 3 | (6) | 4 | (7) | 2 | (8) | 2 |
| (9) | 2 | (10) | 1 | (11) | 2 | (12) | 3 | (13) | 3 | (14) | 4 | (15) | 3 | (16) | 5 |
| (17) | 2 | (18) | 4 | (19) | 4 | (20) | 3 | (21) | 5 | (22) | 4 | (23) | 2 | (24) | 1 |
| (25) | 3 | (26) | 5 | (27) | 5 | (28) | 1 | (29) | 3 | (30) | 3 | (31) | 2 | (32) | 1 |
| (33) | 1 | (34) | 1 | (35) | 2 | (36) | 2 | (37) | 3 | (38) | 1,2,3,4,5 | (39) | 3 | (40) | 3 |
| (41) | 3 | (42) | 1 | (43) | 4 | (44) | 1 | (45) | 5 | (46) | 4 | (47) | 2 | (48) | 2 |
| (49) | 4 | (50) | 2 | (51) | 4 | (52) | 1 | (53) | 1 | (54) | 4 | (55) | 5 | (56) | 5 |